# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1945/6 - 2015 දෙසැම්බර් මස 14 වැනි සඳුදා - 2015.12.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/2012(ii)

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14අ, 14ආ, 14ඇ, 14ඈ, 14ඉ, 14ඊ, 14උ, 14ඌ, 14එ, 14ඒ, 14ඔ, 14ඕ, 14ක සහ 14ග යන වගන්ති සමග කියවිය යුතු එම පනතේ 61(1)(ත) වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද අමරවීර,
ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2015 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2014 සැප්තැම්බර් මස 01 දින අංක 1878/12 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2014 අංක 01 දරන මහ මුහුදේ ධීවර මෙහෙයුම් නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

1. එම නියෝගවල 4 වන නියෝගයෙහි-

   (i) (vi) අයිතමයේ ''මුහුදු පක්ෂීන් වැනි තහනම් කරන ලද මත්ස්‍ය විශේෂ සහ ලේබල් කරන ලද සත්ව විශේෂයන්'' යන වචන වෙනුවට ''මුහුදු පක්ෂීන් වැනි තහනම් කරන ලද මත්ස්‍ය විශේෂ '' යන වචන ආදේශ කිරීමෙන්

   (ii) එහි (xi) අයිතමය වෙනුවට පහත දැක්වෙන අළුත් අයිතමය ආදේශ කිරීමෙන් :-

      (xi) බලපත්‍රයක් යටතේ ඇල්ලීම සඳහා අවසර ලබා දී ඇති මෝර මත්ස්‍ය විශේෂයක් වරල් ස්වභාවිකව ශරීරයට බද්ධ වී ඇත්නම් මිස බෝට්ටුව තුළ තබා නොගත යුතු අතර මෝර වරල් පමණක් බෝට්ටුව තුළ තබා නොගත යුතු ය.


1A - PG 2727— 2506 (2015/12)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(iii) එහි (xii) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් අයිතිම ඇතුළත් කිරීමෙන් -

(xiii) 2009.05.05 දින අංක 1600/13 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2009 ධීවර බෝට්ටුවල ආරක්ෂාව (සැලැස්ම, ඉදි කිරීම සහ උපකරණ) නියෝගවල 162 නියෝගයේ විධිවිධානවලට අනුකූලව VHF රේඩියෝ ස්ථාපනයක් සහ HF/MF (SSB) රේඩියෝ පණිවිඩ හුවමාරු ඒකකයක් බෝට්ටුවේ සවිකර එය පවත්වාගෙන යා යුතු ය. මෙහි V වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති ජාත්‍යන්තර ගුවන් විදුලි ඇමතුම් සංඥ බෝට්ටුවේ දෙපැත්තේ පැහැදිලිව සටන් කර තිබිය යුතු ය.

එසේ වුවද, මේ ඡේදයේ විධිවිධාන මීටර් විසිහතරකට වඩා දිගින් වැඩි බෝට්ටුවලට අදළ විය යුතු ය.

(xiv) 2009 ධීවර බෝට්ටුවල ආරක්ෂාව (සැලැස්ම, ඉදි කිරීම සහ උපකරණ) නියෝගවල 105, 106 සහ 107 යන නියෝගවලට අනුකූලව ගිනි නිවන උපකරණ බෝට්ටුවේ ගෙන යා යුතු ය.

එසේ වුව ද, මේ ඡේදයේ විධිවිධාන මීටර් විසිහතරකට වඩා දිගින් වැඩි බෝට්ටුවලට ද අදළ විය යුතු ය.

(xv) අනවසර ධීවර ආම්පන්න බෝට්ටුවේ රැගෙන යාම නොකළ යුතු ය.

(xvi) 2008.10.09 දින අංක 1570/32 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2008 දේශීය ධීවර බෝට්ටු (ජීවිතාරක්ෂක ඇඳුම් කට්ටල) නියෝගවලට අනුකූලව ජීවිතාරක්ෂක ඇඳුම් කට්ටල බෝට්ටුවේ ගමන් ගන්නා වූ සේවක පිරිසට සමාන වූ සංඛ්‍යාවක් බෝට්ටුව තුළ ගබඩා කර තිබිය යුතු ය. හදිසි අවස්ථාවකදී බෝට්ටුවේ සේවක මණ්ඩලය විසින් ඒවා පැළඳ සිටිය යුතු ය.

(xvii) 2015.03.03 දින අංක 1904/10 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2015 අංක 1 දරන ධීවර ආම්පන්න ලකුණු කිරීමේ නියෝගවලට අනුකූලව ධීවර ආම්පන්න ලකුණු කර තිබිය යුතු ය.

(xviii) 2015.03.26 දින අංක 1907/47 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2015 මහ මුහුදේ ධීවර මෙහෙයුම්වල යෙදෙන ධීවර බෝට්ටු චන්ද්‍රිකා දත්ත මගින් අධීක්ෂණය කිරීමේ පද්ධතිය (VMS) ක්‍රියාත්මක කිරීමේ නියෝගවල විධිවිධානයන්ට අනුකූලව ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අනුමත කරනු ලැබූ චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ යාත්‍රා අධීක්ෂණ පද්ධති උපකරණය ගොඩබිම පිහිටි ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය හා සමග සම්බන්ධ වීම සඳහා ධීවර බෝට්ටුවේ සවිකර තිබිය යුතු ය.

(xix) තහනම් කරන ලද මසුන් විශේෂ සහ ජලජ ජීවීන් ධීවර ආම්පන්නවලට හසුවන අවස්ථාවක දී මෙම සතුන් නිදහස් කිරීමට බිලි කොකු ගලවනය (De-hooker), මන්ද හෝ රැහැන් කපනය (Line Cutter) සහ අතංගුව (Dip-Net) මරුවැල් භාවිතයෙන් හා හැඹිලි දැල් භාවිතයෙන් ධීවර මෙහෙයුම් සිදු කරනු ලබන තැනැත්තන් විසින් බෝට්ටුවේ රැගෙන යා යුතු ය.

(xx) දිගින් මීටර් විසිහතරකට වඩා වැඩි බෝට්ටු සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන විද්‍යාත්මක නිරීක්ෂකයෙකු බෝට්ටුවල ගමන් කරවීමට සැලැස්විය යුතු අතර බෝට්ටු අයිතිකරු විසින් එම විද්‍යාත්මක නිරීක්ෂකවරයාට එම බෝට්ටුවේ ප්‍රධාන මෙහෙයුම්කරුට ලබා දී ඇති පහසුකම් ධීවර මෙහෙයුම් අවසන් වනතුරු ලබාදීම අනිවාර්ය වේ.

එසේ වුවද යම් බෝට්ටුවක ඇති පහසුකම් වර්ග සැලකිල්ලට ගැනීමෙන් පසු මීටර් විසිහතරට වඩා අඩු දිගකින් යුත් යම් බෝට්ටුවක් සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විද්‍යාත්මක නිරීක්ෂකයෙකු සේවයේ යොදවනු ලැබිය හැකි ය.

2. එම නියෝගවල 5 වන නියෝගයට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් නියෝගය එකතු කිරීමෙන් -

''5අ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව මහ මුහුදේ මසුන් අල්ලන කිසිදු තැනැත්තකු විසින් මුහුදේ දී හෝ යම් වරායක දී එම බෝට්ටුවේ ඇති මසුන් වෙනත් බෝට්ටුවකට මාරු නොකළ යුතු ය.''

3. 6 වැනි නියෝගයේ ''බලපත්‍ර දරන්නා'' යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන යෙදුම් එකතු කිරීමෙන් :-

''විද්‍යාත්මක නිරීක්ෂකයා'' යන්නෙන් ඉන්දියන් සාගර ටූනා කොමිෂන් සභාවේ (IOTC) අංක 11/04 යෝජනා සම්මතයට අනුකූලව විද්‍යාත්මක දත්ත එකතු කිරීම සම්බන්ධයෙන් විශේෂ පුහුණුවක් ලැබුවා වූ ද තත් කාර්ය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරනු ලැබුවා වූ ද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත නැතහොත් යම් ප්‍රාදේශීය ධීවර කළමනාකරණ සංවිධානයක් වෙත ලියාපදිංචි වී ඇත්තා වූ ද තැනැත්තකු අදහස් වේ.

''අනවසර ධීවර අම්පන්න'' යන්නෙන් මේ නියෝග යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවසර දී නොමැති ධීවර ආම්පන්න අදහස් වේ.

4. එහි iv වන උපලේඛනයට ඉක්බිතිව ම v වැනි උපලේඛනය එකතු කිරීමෙන්

### v වන උපලේඛනය

***පහත දැක්වෙන පරිදි ජාත්‍යන්තර ගුවන් විදුලි ඇමතුම් සංඥා දර්ශකය (IRCS)***

උදහරණ :

**4SF2514**

අකුරුවල/අංකවල (ප්‍රමාණය) පිරිවිතර - බෝට්ටුව ලකුණු කිරීම සහ හඳුනා ගැනීම සඳහා FAO සම්මත පිරිවිතර

| *බෝට්ටුවේ සම්පූර්ණ දිග මීටර්වලින් (LOR)* | *අකුරුවල සහ ඉලක්කම්වල උස පහත දැක්වෙන මීටර් ප්‍රමාණවලට වඩා අඩු නොවිය යුතු ය* |
|---|---|
| මීටර් 25 සහ ඊට වැඩි | මීටර් 1.0 |
| මීටර් 20 සහ ඊට වැඩි එහෙත් මීටර් 25ට වඩා අඩු | මීටර් 0.8 |
| මීටර් 15 සහ ඊට වැඩි එහෙත් මීටර් 20ට වඩා අඩු | මීටර් 0.6 |
| මීටර් 12 සහ ඊට වැඩි එහෙත් මීටර් 15ට වඩා අඩු | මීටර් 0.4 |
| මීටර් 5 සහ ඊට වැඩි එහෙත් මීටර් 12ට වඩා අඩු | මීටර් 0.3 |
| මීටර් 5 සහ ඊට අඩු | මීටර් 0.1 |

01-36

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.